# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2496/32 – 2026 ජූලි මස 10 වැනි සිකුරාදා – 2026.07.10**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


## I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

**ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහය**

සංශෝධන අංක 03

පහත I කොටසෙහි සඳහන් පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2036/10 හා 2017.09.11 දිනැති සහ II කොටසෙහි අංක 2445/32 හා 2025.07.16 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍ර* මගින් සංශෝධිත අංක 2024/35 දරන 2017.06.21 වැනි දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද ශ්‍රී ලංකා රජයේ පුස්තකාලයාධිපති සේවයේ සේවා ව්‍යවස්ථාව පහත III කොටසේ දැක්වෙන ආකාරයට සංශෝධනය කරනු ලැබේ. එහි සඳහන් අනෙකුත් කරුණු හා කොන්දේසි නොවෙනස්ව පවතී.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය පරිදි,

**එන්. යූ. නිෂාන් මෙන්ඩිස්,**
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්.

2026 ජූලි මස 07 වැනි දින.

**I කොටස**

සංශෝධන අංක 01 - 2017 සැප්තැම්බර් මස 11 වැනි දින හා අංක 2036/10 *අති විශෙෂ ගැසට් පත්‍රය.*

**II කොටස**

සංශෝධන අංක 02 - 2025 ජූලි මස 16 වැනි දින හා අංක 2445/32 *අති විශෙෂ ගැසට් පත්‍රය.*


1A – G 047218 – 04 (2026/07)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## III කොටස

පහත පරිදි සංශෝධනය විය යුතු අතර අනෙකුත් කරුණු නොවෙනස්ව පවතී.

7.2.2.2 වෘත්තීය සුදුසුකම්:

(ඇ) පුස්තකාල විද්‍යාව පිළිබඳ ඉහත 7.2.2.2 (අ) හෝ (ආ) සුදුසුකම්වලට සමාන හෝ ඉහළ සුදුසුකමක් ලබා තිබීම. (එවැනි සුදුසුකම් අදාළ විශ්වවිද්‍යාලවල බලධාරීන්, ශ්‍රී ලංකා පුස්තකාල සංගමය සහ අවස්ථානුකූලව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විමසමින් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තීරණය කරනු ලැබේ.)

7.2.4.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය: ලකුණු ලබා දෙනු නොලැබේ.

ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු : සුදුසුකම් පරීක්ෂා කිරීම.

7.3.2.2 වෘත්තීය සුදුසුකම්:

(ඇ) පුස්තකාල විද්‍යාව පිළිබඳ ඉහත 7.3.2.2 (අ) හෝ (ආ) සුදුසුකම්වලට සමාන හෝ ඉහළ සුදුසුකමක් ලබා තිබීම. (එවැනි සුදුසුකම් අදාළ විශ්වවිද්‍යාලවල බලධාරීන්, ශ්‍රී ලංකා පුස්තකාල සංගමය සහ අවස්ථානුකූලව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විමසමින් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තීරණය කරනු ලැබේ.)

7.3.2.3 පළපුරුද්ද:

(අ) (i) රජයේ සේවයේ (පළාත් රාජ්‍ය සේවාවල නොවන) දෙපාර්තමේන්තුගත ප්‍රාථමික ශිල්පීය නොවන (PL-01) සේවා ගණයේ පුස්තකාල සහයක / පුස්තකාල සේවක තනතුරක

හෝ

(ii) සක්‍රියව හා අඛණ්ඩව පුස්තකාල හා සම්බන්ධ රාජකාරි කටයුතුවල නියැලෙන බවට දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් විධිමත්ව තහවුරු කරනු ලබන තනතුරක

ස්ථිර කර තිබීම සහ එම තනතුරෙහි වසර 10 ක සක්‍රීය සේවා කාලයක් සපුරා තිබීම.

(ආ) ඉහත 7.3.2.2 හි (අ), (ආ) සහ (ඇ) හි සඳහන් සුදුසුකම්වලින් එකක් හෝ සම්පූර්ණ කර ඇත්නම්, එම අපේක්ෂකයන් ඉහත 7.3.2.3 (අ) හි (i) හෝ (ii) සඳහන් තනතුරක

ස්ථිර කර තිබීම සහ අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් වන නියමිත දිනට එම තනතුරේ වසර 05 ක සක්‍රීය සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම ප්‍රමාණවත් වේ.

7.3.2.5 වෙනත්:

(i) අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් වන නියමිත දිනට 7.3.2.3 හි සඳහන් තනතුරක සේවයේ ස්ථිර කර තිබිය යුතු අතර රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හා ඊට ආනුෂංගික චක්‍රලේඛයන්හි සඳහන් විධිවිධානවලට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතු අතර ඒ බව දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සහතික කර තිබිය යුතුය.

10.1.1.1 සපුරාලිය යුතු සුදුසුකම්:

(iv) රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හා ඊට ආනුෂංගික චක්‍රලේඛයන්හි සඳහන් විධිවිධානවලට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතු අතර ඒ බව දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සහතික කර තිබීම.

10.2.1.1 සපුරාලිය යුතු සුදුසුකම්:

(ii) රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හා ඊට ආනුෂංගික චක්‍රලේඛයන්හි සඳහන් විධිවිධානවලට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතු අතර ඒ බව දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සහතික කර තිබීම.

10.3.1.1 සපුරාලිය යුතු සුදුසුකම්:

(ii) රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හා ඊට ආනුෂංගික චක්‍රලේඛයන්හි සඳහන් විධිවිධානවලට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතු අතර ඒ බව දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් සහතික කර තිබීම.

EOG 07 – 0131

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.